ජාතික ශිල්ප සභාව

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

තනතුරු ඇබෑර්තු

ජාතික ශිල්ප සභාවේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(01) සහකාර අධ්‍යක්ෂ (පළාත්) තනතුර - (පුරප්පාඩු - 01)

කළමනාකාර සේවා ශ්‍රේණියේ II ශ්‍රේණිය (MM 1-1)

(උතුරු පළාතේ පුරප්පාඩුව පවතී)

සුදුසුකම් :

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය, සමාජ විද්‍යාව, ප්‍රජා විද්‍යාව, පුරා විද්‍යාව, වාණිජ්‍යය හෝ සෞන්දර්යය විෂයයක් සහිතව ලබාගත් උපාධිය

සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක සංවර්ධන සහ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

සටහන :

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ දැනුම අමතර සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය :

MM 1-1 2016 - රු. 53,175/- 10 x 1,375 - 15 x 1,910 - 95,575/- (මාසික)

මීට අමතරව රජයේ අනුමත දීමනාවන් හිමි වේ.
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ)

වයස් සීමාව :

අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

(02) ගිණුම් සහ ප්‍රසම්පාදන නිලධාරී තනතුර - (පුරප්පාඩු - 01)

කනිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියේ II ශ්‍රේණිය. (JM 1-1)

ජාතික ශිල්ප සභා ප්‍රධාන කාර්යාලයේ පුරප්පාඩුව පවතී.

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් සඳහා

(I) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගිණුම්කරණ ක්ෂේත්‍රයේ ලබාගත් උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක දේශීය හා විදේශීය සැපයුම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද

සහ

(II) පිළිගත් ආයතනයකින් සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව වසරක (01) සහතික පත්‍ර පාඨමාලාවක් පිළිබඳ සහතිකය ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

ගිණුම් සහ ප්‍රසම්පාදන කටයුතු වල නිරත ජාතික ශිල්ප සභාවේ තාක්ෂණික නොවන සේවා ශ්‍රේණියේ I ශ්‍රේණියේ කළමනාකරණ සහකාරවරයෙකු ලෙස අවම වශයෙන් වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

වැටුප් පරිමාණය :

JM 1-1 2016 - රු. 42,600/- 10 x 755 - 18 x 1,135 - 70,580/- (මාසික)

මීට අමතරව රජයේ අනුමත දීමනාවන් හිමි වේ.
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ)

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

(03) පාලන සහකාර තනතුර - (පුරප්පාඩු - 01)

ආශ්‍රිත නිලධාරී සේවා ශ්‍රේණියේ III ශ්‍රේණිය (MA - 3)

ජාතික ශිල්ප සභා ප්‍රධාන කාර්යාලයේ පුරප්පාඩුව පවතී.

සුදුසුකම් :

රාජ්‍ය පරිපාලන, ව්‍යාපාර පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, නීතිය, කළමනාකරණය හෝ ඒ හා අදාළ ක්ෂේත්‍රයන් සම්බන්ධව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමත් විය යුතුය.

සටහන :

උපාධිය ලබාගත් පසුව ආයතනික හා පරිපාලන කාර්යයන්ට අදාළව ලබාගත් පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය :

MA 3 - 2016 - රු. 32,200/- 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,960/- (මාසික)

මීට අමතරව රජයේ අනුමත දීමනාවන් හිමි වේ.
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ)

වයස් සීමාව

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

(04) සංවර්ධන සහකාර තනතුර - (පුරප්පාඩු - 21)

ආශ්‍රිත නිලධාරී සේවා ශ්‍රේණියේ III ශ්‍රේණිය (MA - 3)

(ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල පුරප්පාඩු පවතී)

සුදුසුකම් :

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, ආර්ථික විද්‍යාව, කළමනාකරණය, වාණිජ්‍යය, සමාජ විද්‍යාව, ප්‍රජා විද්‍යාව, පුරා විද්‍යාව හෝ සෞන්දර්යය විෂයයක් සහිතව ලබාගත් උපාධිය

සටහන :

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සංවර්ධන හා ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය :

MA 3 - 2016 - රු. 32,200/- 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,960/- (මාසික)

මීට අමතරව රජයේ අනුමත දීමනාවන් හිමිවේ.
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

(05) කළමනාකරණ සහකාර තනතුර - (පුරප්පාඩු 10)

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ශ්‍රේණියේ III ශ්‍රේණිය (MA - 1-2)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන :

(I) අ.පො.ස. (සා.පෙ.) විභාගය සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

සහ

(II) අ.පො.ස. (උ.පෙ.) විභාගය සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර විෂයන් 03 කින් සමත් වී තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

ජාතික ශිල්ප සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණියේ (PL - 3) වැටුප් කාණ්ඩය හිමි සහ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණියේ (PL 1) වැටුප් කාණ්ඩය හිමි පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ සේවක / සේවිකාවන්ට අයදුම් කළ හැකිය.

(I) අ.පො.ස. (සා.පෙ.) විභාගය මව් භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සමත් වීම

සහ

(II) ඉහත සේවා ශ්‍රේණියන්හි ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය :

MA 1-2 - 2016 - රු. 27,910/- 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - 49,080/- (මාසික)

මීට අමතරව රජයේ අනුමත දීමනාවන් හිමිවේ.
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

(06) හස්ත කර්මාන්ත ව්‍යාප්ති සහකාර තනතුර - (පුරප්පාඩු 04)

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ශ්‍රේණියේ III ශ්‍රේණිය (MA 1-2)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් සඳහා

අධ්‍යාපන :

(I) අ.පො.ස. (සා.පෙ.) විභාගය සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම.

සහ

(II) අ.පො.ස. (උ.පෙ.) විභාගය සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර විෂයන් 03 කින් සමත් වී තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

ජාතික ශිල්ප සභාවේ ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණියේ (PL - 3) වැටුප් කාණ්ඩය හිමි සහ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණියේ (PL 1) වැටුප් කාණ්ඩය හිමි පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ සේවක / සේවිකාවන්ට අයදුම් කළ හැකිය.

(I) අ.පො.ස. (සා.පෙ.) විභාගය මව් භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සමත් වීම

සහ

(II) ඉහත සේවා ශ්‍රේණියන්හි ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප් පරිමාණය :

MA 1-2 - 2016 - රු. 27,910/- 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710 - 49,080/- (මාසික)

මීට අමතරව රජයේ අනුමත දීමනාවන් හිමිවේ.
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ.)

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

(07) ප්‍රදර්ශක තනතුර - (පුරප්පාඩු - 21)

කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ශ්‍රේණියේ III ශ්‍රේණිය (MA 1-2)

සුදුසුකම් :

(I) අ.පො.ස. (සා.පෙ.) විභාගය සම්මාන සාමාර්ථ හතරක් සහිතව (සිංහල / දෙමළ භාෂාව සහ ගණිතය විෂයන්ට සම්මාන සාමාර්ථ ඇතුළුව) විෂයන් හයකින් (06) ක් සමත් වීම

සහ

(II) පිළිගත් රාජ්‍ය ආයතනයකින් ලබාගත් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වසරක (01) පුහුණු සහතිකය සමඟ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක සේවා පළපුරුද්ද ලබා තිබීම

හෝ

(III) හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වසර 03 ක සේවා පළපුරුද්ද සමඟ ජනාධිපති හස්ත කර්මාන්ත තරගයේ ජාතික මට්ටමේ සම්මානලාභියෙකු වීම

වැටුප් පරිමාණය :

MA 1-2-2006A - රු. 13,450/- 10 x 145 - 7 x 170 - 12 x 290 - 12 x 345 - 23,710/- (මාසික)

මීට අමතරව රජය විසින් අනුමත දීමනාවන් ද ගෙවනු ඇත.

වයස් සීමාව :

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(උපරිම වයස් සීමාව අභ්‍යන්තර සේවකයින් කෙරෙහි බල නොපානු ඇත)

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයින්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට තෝරාගනු ලබන අයදුම්කරු විසින් සභාව යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔබගේ සම්පූර්ණ මාසික වැටුපෙන් 8% කට නොඅඩු මුදලක් දායක කළ යුතු අතර, ජාතික ශිල්ප සභාව 12% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් සඳහා 3% ක් ජාතික ශිල්ප සභාව විසින් ගෙවනු ලැබේ.

සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවා අවශ්‍යතාවය මත සේවය කිරීමට සිදු වනු ඇත.

අයදුම්කරුවන් සියලුම විස්තර සහිතව තම අයදුම්පත් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, වෘත්තීය සහතික සහ පළපුරුද්ද දක්වෙන සහතික වල පිටපත් සමඟ බත්තරමුල්ල, පැලවත්ත, රෝහිනා මාවතේ පිහිටි ජාතික ශිල්ප සභාවේ සභාපති වෙත ලියාපදිංචි තැපැලෙන් **2020 දෙසැම්බර් 15** දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "______________ **තනතුර සඳහා අයදුම්පත**" යනුවෙන් සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශය සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

සභාපති,
ජාතික ශිල්ප සභාව,
රෝහිනා මාවත, පැලවත්ත,
බත්තරමුල්ල.